# කොළඹ ආනන්ද විද්‍යාලයීය "ආදි ආනන්දීය බෞද්ධ සංගමයේ" ව්‍යවස්ථාවෙන්

1. නාමය - "ආදි ආනන්දීය බෞද්ධ සංගමය" යනුවෙනි.

2. (අ) විද්‍යාලයීය බෞද්ධ සංගමයේ ක්‍රියාකාරී මණ්ඩලයේ සේවය කළ අය සහ ආදි ශිෂ්‍යයන් අතර ගුණාත්මක සබඳතාවක් ඇති කිරීම.

   (ආ) විද්‍යාලය කළ ජාතික, ආගමික, අධ්‍යාපනික හා සංස්කෘතික වර්ධනයක් ඇති කිරීම.

   (ඇ) ආනන්ද විද්‍යාලය සහ බාහිර යෝග්‍ය සංවිධාන හා පුද්ගලයන් අතර සම්බන්ධතාවයක්, ඒ තුළින් ජාතික, ආගමික, සංස්කෘතික වර්ධනයක් ඇති කිරීම.

   (ඈ) බුද්ධ ධර්මයේ සහ බෞද්ධ සංස්කෘතියේ උන්නතිය සඳහා ජාතික වූත් ජාත්‍යන්තර පියවරක් ගැනීමත්ය.

3. අනුශාසකවරු - විද්‍යාලාධිපති තුමා සහ විද්‍යාලයීය බෞද්ධ සංගමයේ අනුශාසක ස්වාමීන් වහන්සේ නිලබලයෙන්ම අනුශාසකවරු වෙති.

4. ක්‍රියාකාරී මණ්ඩලය - සංගමයේ සාමාජිකයන් අතුරින් ව්‍යවස්ථාවට අනුකූලව තෝරාපත් කර ගනු ලබයි.

5. සාමාජිකත්වය :

   (අ) සාමාජිකත්වය (යාවජීව විශයෙනි)

   (ආ) විද්‍යාලයීය අධ්‍යයනය අවසන් කොට ඇති බෞද්ධ අයට පමණක් අදාල සාමාජික මුදල ගෙවීමෙන් ලබාගත හැක.

6. සාමාජිකයන් බඳවා ගැනීම :

   (අ) මෙහි ඇති අයදුම් පත්‍රය මගින් අදාල සාමාජික මුදල සමඟ ගරු ලේකම් වරයා වෙත ලැබේන්නට සැලැස්විය යුතුය. සෑම අයදුම් පතක්ම ක්‍රියාකාරී මණ්ඩලයේ සම්මතයෙන් අනතුරුව සාමාජිකත්වය හිමිවේ. කවර හෝ ඉල්ලුම් පතක් ක්‍රියාකාරී මණ්ඩලය මගින් ප්‍රතික්ෂේප කලහොත් එසේ කිරීමට හේතු දැක්වීමට ක්‍රියාකාරී මණ්ඩලය බැඳී නැත.

   (ආ) සෑම සාමාජිකයකුටම ගරු ලේකම් විසින් සාමාජික අංකයක් ලබා දිය යුතුය.

   (ඇ) වර්ෂ කීපයක් සාමාන්‍ය සාමාජික මුදල් නොගෙවන ලද සෑම සාමාන්‍ය සාමාජිකයකුටම සියළු හිඟ මුදල් එකවර ගෙවීමෙන් පමණක් පැරණි සාමාජික අංකය ලබා ගත හැක.

★ පසුපිටෙහි සඳහන් සහතික කිරීම සඳහා වෙන් කර ඇත.

Scanned by CamScanner